**මාධ්‍ය නිවේදනය**

2020 ජනවාරි 31, කොළඹදී...

Good Food, Good Life

# නෙස්ලේ ලංකා සමාගම 2025 වසර වනවිට සිය ඇසුරුම්කරණ 100%ක්ම ප්‍රතිචක්‍රීයකරණයට හෝ නැවත භාවිතා කළ හැකි තත්ත්වයට ගෙනඒමට කැපවෙයි

*'මගේ ශ්‍රී ලංකාව වඩාත් තිරසාර කිරීම' යන වැඩසටහන යටතේ හරිත පියවර ගණනාවක් ආරම්භ කරයි*

නෙස්ලේ ලංකා සමාගම 2025 වසර වනවිට තම නිෂ්පාදන ඇසුරුම්කරණ 100%ක්ම ප්‍රතිචක්‍රීයකරණයට හෝ නැවත භාවිතයට සුදුසු ලෙස නිර්මාණය කිරීමට සැලසුම් කර තිබේ. ඒ හරහා නෙස්ලේ සමාගම අරමුණු කරන්නේ ප්ලාස්ටික් ඇතුළු තම ඇසුරුම් කිසිවක් කසල ලෙස හෝ කසල අංගණ කරා ගමන් නොකරන බවයි. පිරිසිදු හා හරිත රටක් වෙනුවෙන් කැපවී සිටින නෙස්ලේ සමාගම තම 'මගේ ශ්‍රී ලංකාව වඩාත් තිරසාර කිරීම' යන වැඩසටහන යටතේ මේ වනවිට පරිසර හිතකාමී පියවර ගණනාවක් ආරම්භ කර තිබේ.

"ශ්‍රී ලංකාව තුළ මුල් බැසගත් සමාගමක් ලෙස පරිසරයට ඇසුරුම්කරණ මගින් සිදුවන බලපෑම් අවම කරමින් පරිසරය ආරක්ෂා කරගැනීම අප සතු වගකීමක් බව අපගේ විශ්වාසයයි. නෙස්ලේහි අපි වසර ගණනාවක් පුරා අපගේ සන්නාම, නිෂ්පාදන හා මෙහෙයුම්වල තිරසාරභාවය වෙනුවෙන් ක්‍රියාකරමින් සිටින්නෙමු. මෙරට පිහිටි අපගේ සියලුම නෙස්ලේ කාර්යාල සහ පහසුකම් ස්ථානවල ප්ලාස්ටික් අපද්‍රව්‍ය වලින් තොර සංස්කෘතියක් මෙහෙයවන අතර, මේ වසරේ අප්‍රේල් මාසයේ සිට ප්ලාස්ටික් ප්‍රවර්ධන භාණ්ඩ නැවැත්වීමට අප තීරණාත්මක ලෙස පියවර ගෙන ඇත. මේ ක්‍රියාදාමය හරහා 2020 වසරේදී ප්ලාස්ටික් මෙට්‍රික් ටොන් 250ක් පමණ භාවිතයෙන් වැළකී සිටීමට හැකිවනු ඇතැයි අපගේ විශ්වාසයයි" යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ෆැබ්‍රිස් කැවලින් මහතා පැවසීය.

"විශේෂයෙන්ම අපේ කුරුණෑගල කර්මාන්තශාලාව මේ වනවිට 'කසල බැහැර කිරීම් ශුන්‍ය මට්ටමට පත්ව තිබීම' පිළිබඳ මම ප්‍රකාශකරන්නේ ඉතාම සතුටින්. ඉන් අදහස් වන්නේ එම කර්මාන්තශාලාවෙන් කිසිදු අපද්‍රව්‍යයක් කසල අංගණවලට එකතුවීමක් හෝ බලශක්තිය ඉපදවීමකින් තොරව දහනය නොකිරීමයි" යනුවෙන් ෆැබ්‍රිස් මහතා වැඩිදුරටත් පැවසීය. "මගේ ශ්‍රී ලංකාව වඩාත් තිරසාර කිරීම සඳහා අපි කටයුතු කරනවා. කොහොමනමුත් අපිට ඒ සඳහා තවත් වැඩකටයුත බොහෝ දේ කළ හැකි බව අපට හැඟෙනවා. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ අපගේ ප්ලාස්ටික් භාවිතය තවදුරටත් අඩුකිරීමට අලුත් හා අභියෝගකාරී ව්‍යාපෘති භාරගැනීමටත්, 2025 වනවිට අපගේ ඇසුරුම් 100%ක්ම ප්‍රතිචක්‍රීයකරණය හෝ නැවත භාවිතකළ හැකි ලෙස නිර්මාණය කිරීමටත් අපි කැපවී සිටිනවා" ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය.

තම නවතම හරිත පියවරයක් වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හා මධ්‍යම පරිසර අධිකාරිය (Central Environment Authority) හා එක්ව පාසල්වල නිසි කසළ කළමනාකරණය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැඩපිළිවෙළකට ද නෙස්ලේ සමාගම සිය දායකත්වය ලබාදී ඇත. මෙම වැඩසටහන යටතේ මධ්‍යම පරිසර අධිකාරිය පාසල් පරිසර සමිති දැනුවත් කරමින් ශ්‍රී ලංකාවේ අනාගත පරපුරට මෙම වැදගත් පණිවුඩය පැතිරවීමට බලගන්වයි. ඒ අතරම නෙස්ලේ සමාගම මෙම පාසල්වලට කසල

නිසි අයුරින් එක්රැස් කිරීමේ හා වෙන් කිරීමේ හැකියාවෙන් යුතු අපද්‍රව්‍ය කළමනාකරණ ඒකක පරිත්‍යාග කිරීමට කටයුතු කරන අතර ඒ හරහා ප්‍රතිලාභ ලබන දරුවන් ප්‍රමාණය 150,000කට අධික ය.

මේ අතර නෙස්ලේ සමාගම ටෙට්‍රා පැක් (Tetra Pak) හා වෙනත් පාර්ශ්වකරුවන් හා එක්ව 2020 මාර්තු මාසයේදී මෙරට ප්‍රථම යූ.එච්.ටී. (UHT) කිරිපිටි ඇසුරුම් ප්‍රතිචක්‍රීයකරණ පහසුකම හඳුන්වාදීමට ද සැලසුම් කර තිබේ.

නෙස්ලේ සමාගමේ මෙම සමස්ත කැපවීම පසුපස රැඳී ඇති අරමුණ වන්නේ ඇසුරුම්කරණ ද්‍රව්‍ය, කසල අංගණ, ගංගා ඇළදොළ සහ මුහුදු වෙත එකතු වීම වළක්වාගැනීමටය.

නෙස්ලේ සමාගමේ 'මගේ ශ්‍රී ලංකාව වඩාත් තිරසාර කිරීම' යන වැඩසටහන පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://www.nestle.lk/home/planet වෙත පිවිසෙන්න.

---